# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


## 2021 සැප්තැම්බර් මස 10 වන දින

## II වන කොටස

## අතිරේකය

(2021.09.10 දින නිකුත් කරන ලදී)


# දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන)

**(19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 6.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 53 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ යම් වරදක් සිදු කරනු ලබන අවස්ථාවේ වයස අවුරුදු දහඅටට අඩු යම් තැනැත්තකුට එරෙහිව මරණීය දණ්ඩනය ප්‍රකාශයට පත්කිරීම හෝ වාර්තා කිරීම නොකළ යුතු බවට සහ මරණීය දණ්ඩනයෙන් දඬුවම් කිරීම වෙනුවට ඔහු රඳවා තැබීමේ ආයතනයක රඳවා තැබීමට විධිවිධාන සැලැස්වීම වේ.

# දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන)

එල්.ඩී.—ඕ. 12/2021

## (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

1. මේ පනත 2021 අංක දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

19 වන අධිකාරයේ 53 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

2. (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 53 වන වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තන්ට මරණීය දණ්ඩනය වෙනුවට රඳවා තැබීමේ දණ්ඩනය නියම කිරීම

53. (1) යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන අවස්ථාවේ දී ඒ තැනැත්තාගේ වයස අවුරුදු දහඅටට අඩු නම්, ඒ තැනැත්තාට එරෙහිව මරණීය දණ්ඩනය ප්‍රකාශයට පත් කිරීම හෝ වාර්තාගත කිරීම නොකළ යුතු ය.

(2) අධිකරණය විසින්, එවැනි තැනැත්තකු සඳහා මරණීය දණ්ඩනය නියම කිරීම වෙනුවට, වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තන් රඳවා තැබීම සඳහා යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවා ඇති යම් ආයතනයක, දණ්ඩනයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාවක් සඳහා රඳවා තැබීමේ දණ්ඩනයක් එම ලිඛිත නීතියේ විධිවිධානවලට යටත්ව, නියම කරනු ලැබිය යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.